

වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා
දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත
රාජ්‍ය අමාත්‍යාංශය

කාර්ය සාධන වාර්තාව - 2021

අංක 01, ඩී.ආර්.විජේවර්ධන මාවත, කොළඹ - 10

පටුන

1. වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය .. 3
1.1. හැඳින්වීම 3
1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර 4
1.3. ප්‍රධාන කාර්යයන් 5
1.4. සංවිධාන සටහන 6
1.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු 7
1.6. අමාත්‍යාංශය යටතේ පවතින ආයතන 7
1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු 7
2. අමාත්‍යාංශයේ ප්‍රගතිය හා ඉදිරි දැක්ම 8
2.1. විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක 8
3. 2021 වසර සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය 18
3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 18
3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 20
3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 21
3.4. මූල්‍ය ප්‍රකාශ සටහන් 23
3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 23
3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්ය සාධනය 23
3.7. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 23
3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 24
3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව** 24
4. කාර්ය සාධන දර්ශක 25
4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 25
5. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරාගැනීමේ කාර්ය සාධනය 26
5.1. හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු 26
5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 28
6. මානව සම්පත් පැතිකඩ 30
6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය 30
6.2. ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපාන අයුරු 30
6.3. මානව සම්පත් සංවර්ධනය 31
7. අනුකූලතා වාර්තාව 32

1. වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය

1.1. හැඳින්වීම

රජයේ 'සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දැක්වෙන විශේෂ ප්‍රමුඛතාවයන් ක්‍රියාවට නංවාලීම අරමුණු කරගනිමින් ස්ථාපිත කර ඇති මෙම අමාත්‍යාංශය රටේ සංවර්ධනයට සෘජු දායකත්වයක් දක්වන, ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතාවලට අත්‍යවශ්‍ය වන ප්‍රධාන ආයතන හතරකින් සමන්විත වේ. ඒ අතුරින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව හා ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය මහජනතාවට ඉතා සමීප හා අත්‍යවශ්‍ය සේවා සපයන අතර ලක්දිව ඉංජිනේරු සමාගම බස් රථ හා වාහන අලුත්වැඩියා හා සේවා සපයමින් ප්‍රවාහන ක්ෂේත්‍රයට නිහඬ දායකත්වයක් දක්වයි. මෙම ආයතන හතර සම්බන්ධීකරණය කර ගනිමින්, ප්‍රවාහනයට සම්බන්ධ පාර්ශවකාර ආයතනවල දායකත්වයෙන් ජනතාවට කාර්යක්ෂම හා සුව පහසු ප්‍රවාහන සේවාවක් ලබා දීම මඟින් ආර්ථික හා සමාජීය සංවර්ධනය සඳහා ව්‍යාපෘති හඳුනාගැනීම, ව්‍යාපෘති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම, ප්‍රගති සමාලෝචනය කිරීම හා ඇගයීම අඛණ්ඩව සිදු කරනු ලබයි. අර්ධ මාසික හා මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වා ආයතන මඟින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති හා වැඩ සටහන් අඛණ්ඩව කරගෙන යාමට අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම් මෙම අමාත්‍යාංශය විසින් ලබා දෙනු ඇත.

නවීන තාක්ෂණය ආයතනවලට හඳුන්වාදීමේ වැඩසටහන් යටතේ සුහුරු තාක්ෂණික ක්‍රමවේදයන් ප්‍රචලිත කිරීම මඟින් සේවාලාභීන්ට කාර්යක්ෂම සේවාවක් ලබාදීමට මෙන්ම අල්ලස, දූෂණය හා නාස්තිය අවම කර ගැනීමට ද ආයතන කෙරෙහි ජනතාව තුළ පවතින අසුබවාදී ආකල්ප ඉවත් කර සුබවාදී හා ධනාත්මක ආකල්ප ගොඩනඟා ගැනීමටද මඟ පෑදෙනු ඇත. තව ද මේ යටතේ මාර්ගගත ක්‍රමවේදයන් ඔස්සේ කලින් වේලාව වෙන්කරවා ගෙන සේවා ලබා ගැනීම, ජංගම සේවා පවත්වා ජනතාව වෙත ම ගොස් සේවා ලබා දීම හා නවීන ලේඛන සංරක්ෂණය කළමනාකරණ ක්‍රමවේදයන් මඟින් ජනතාවට කාර්යක්ෂම සේවාවක් ලබා දීමට ද කටයුතු යොදා ඇත. එසේ ම මාර්ග ආරක්ෂාව සඳහා වූ වැඩසටහන් මෙන් ම ප්‍රාදේශීයව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති ප්‍රවාහන කළමනාකරණ කමිටු මඟින් ද ජනතා ගැටලු නිරාකරණය කිරීමට කටයුතු කරනු ඇත.

මේ සියලු කටයුතු සම්බන්ධීකරණය කිරීම හා අධීක්ෂණය කිරීම මෙම රාජ්‍ය අමාත්‍යාංශය යටතේ සිදුවන අතර මෙම අමාත්‍යාංශය ප්‍රධාන ගණන් දීමේ නිලධාරීවරයකුගේ අධීක්ෂණය යටතේ පාලන, සංවර්ධන, ගිණුම්, සැලසුම්, තාක්ෂණ හා අභ්‍යන්තර විගණන යන අංශ හයකින් සමන්විත වේ. අමාත්‍යාංශය, එයට අයත් ආයතනවල දායකත්වය යටතේ 2021 වසර තුළ ඵලදායිවූ වැඩ සටහන් රාශියක් ක්‍රියාත්මක කර ඇති අතර පවතින අභියෝගවලට සාර්ථකව මුහුණ දෙමින් පොදු ප්‍රවාහනය භාවිතය කෙරෙහි ජනතාව පෙළඹවීමේ වැඩසටහන් රාශියක් ද ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර

දැක්ම

ජනතා කේන්ද්‍රීය තිරසර ප්‍රවාහන පද්ධතියක් සහිත

ශ්‍රී ලංකාවක්

මෙහෙවර

රාජ්‍ය හා පෞද්ගලික ආයෝජන තුළින් නවීන, පරිසර හිතකාමී, ආරක්ෂිත හා සුපිළිපන් ප්‍රවාහන සේවාවක් සඳහා ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, ක්‍රියාවලි විමංශනය, නියාමනය මඟින් තිරසරව කළමනාකරණය කිරීම

1.3. ප්‍රධාන කාර්යයන්

ප්‍රවාහන අමාත්‍යාවරයාගේ හා වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාවරයාගේ උපදෙස් හා මහපෙන්වීම මත ‘‘කාර්යක්ෂම හා පරිසර හිතකාමී පොදු ප්‍රවාහන පද්ධතියක් සඳහා ප්‍රවාහන ජාලය සංවර්ධනය කිරීම’’ සඳහා අදාළ නීති සහ අණපනත් වලට අනුකූලව වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන් හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

1.3.1. සුවිශේෂී ප්‍රමුඛතාවයන්

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ නියෝග පරිදි 2020ක්වූ අගෝස්තු මස 09 දිනැතිව නිකුත් කරන ලද අංක 2187/27 අති විශේෂ ගැසට් නිවේදනයේ පහත සඳහන් ප්‍රතිපාදන ප්‍රකාරව පවරා ඇති විශේෂ ප්‍රමුඛතා ක්ෂේත්‍ර කෙරෙහි මෙම අමාත්‍යාංශය ප්‍රමුඛ අවධානයක් යොමු කරනු ලැබ ඇත.

1) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය ලාබ උපයන ආයතනයක් බවට නවීකරණය කිරීම හා ප්‍රධාන බස් නැවතුම්පොළවල පොදු පහසුකම් සංවර්ධනය කිරීම
2) වත්මන් බස් සංචිතය ප්‍රතිස්ථාපනය කර කොළඹ හා ප්‍රධාන නගර සීමාව තුළ ධාවනය කිරීම සඳහා පරිසර හිතකාමී නව බස් රථ හඳුන්වා දීම සහ පුද්ගලික මගී ප්‍රවාහනය ද ‘‘හරිත ප්‍රවාහන’’ සංකල්පයට අනුකූල කර ගැනීම සඳහා ක්‍රමවේද සැකසීම හා ක්‍රියාත්මක කිරීම
3) දුම්රිය මැදිරි, බස් රථ, මෝටර් රථ දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීම, අලුත්වැඩියා කිරීම හා වැඩි දියුණු කිරීමට ආයෝජකයින් දිරිගන්වන ප්‍රවාහන සේවාවක් ගොඩනැගීම
4) සිසු සිසුවියන්ගේ ආරක්ෂාව සැලසෙන ප්‍රමිතීන් යටතේ පාසල් බස් රථ සේවාව ශක්තිමත් කිරීම
5) ග්‍රාමීය ප්‍රදේශ වෙත පොදු ප්‍රවාහන පහසුකම් ලබා දීම ක්‍රමවත් කිරීම සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොමු කිරීම
6) මගී හා ප්‍රවාහන සේවක ආරක්ෂාව තහවුරු වන පරිදි ප්‍රවාහන සේවාවන් ඉහළ ප්‍රමිතියක් තුළ නියාමනය කිරීම
7) රියදුරු බලපත් නිකුත් කිරීමේ හා මෝටර් රථ ලියාපදිංචි කිරීමේදී සිදුවන විවිධ අක්‍රමිකතා ඉවත්කොට කාර්යක්ෂම සේවාවක් ලබා දීම

1.4. සංවිධාන සටහන


වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය
ලේකම්
ආයතන අංශය
සංවර්ධන අංශය
සැලසුම් අංශය
නාක්ෂණ අංශය
ශිෂ්‍යත්ව අංශය
අභ්‍යන්තර විගණන අංශය
අතිරේක ලේකම් (විශේෂ)
ශ්‍රී ල.ප.සේ
ජෙ.ස.ලේ. (පාලන)
ශ්‍රී ලං.ප.සේ (I ශ්‍රේණිය)
සහකාර ලේකම් (පාලන)
ශ්‍රී ලං.ප.සේ (II/III ශ්‍රේණිය)
පරිපාලන නිලධාරි
කා.සේ.නි.සේ
(අධි පත්තිය)
භාෂා පරිවර්තක
(භාෂා පර්. සේ. II/III)
සම්බන්ධීකරණ ලේකම්
සංවර්ධන නිලධාරි
කා.සේ.සේ
රියදුරු
අතිරේක ලේකම්
ශ්‍රී ල.ප.සේ (විශේෂ)
ජෙ.ස.ලේ. (සංවර්ධන)
ශ්‍රී ලං.ප.සේ
(I ශ්‍රේණිය)
සංවර්ධන නිලධාරි
කා.සේ.සේ
අධ්‍යක්ෂ (සැලසුම්)
ශ්‍රී ලං.ඉ.සේ
(I ශ්‍රේණිය)
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ
ශ්‍රී ලං.ඉ.සේ
(II/III ශ්‍රේණිය)
සංවර්ධන නිලධාරි
කා.සේ.සේ
අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රීලඉසේ
(විශේෂ)
අධ්‍යක්ෂ
ශ්‍රී ලං.ඉ.සේ (I ශ්‍රේණිය)
සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ
ශ්‍රී ලං.ඉ.සේ
(II/III ශ්‍රේණිය)
සංවර්ධන නිලධාරි
කා.සේ.සේ
ඩිඩියෝ කැමරා ශිල්පී
ප්‍රධාන ගණකාධිකාරි
ශ්‍රී ලං.ග.සේ (I ශ්‍රේණිය)
ගණකාධිකාරි
ශ්‍රී ලං.ග.සේ
(II/III ශ්‍රේණිය)
සංවර්ධන නිලධාරි
කා.සේ.සේ
ප්‍රධාන අභ්‍යන්තර විගණක
ශ්‍රී ලං.ග.සේ (I ශ්‍රේණිය)
අභ්‍යන්තර විගණක
ශ්‍රී ලං.ග.සේ
(II/III ශ්‍රේණිය)
සංවර්ධන නිලධාරි
කා.සේ.සේ

1.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

1. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

1.6. අමාත්‍යාංශය යටතේ පවතින ආයතන

1. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
2. ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය
3. සීමාසහිත ලක්දිව ඉංජිනේරු සමාගම

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු -

ව්‍යාපෘතියේ නම	දායක නියෝජිතායතනය	ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම	ව්‍යාපෘති කාල සීමාව
ඉන්දියානු ණය ආධාර යටතේ ශ්‍රී ලංගමය වෙත බස් රථ 500 ක් මිලදී ගැනීම	ඉන්සියානු එක්සිම් බැංකුව	• විදේශ ණය ආධාර (12) - USD 15.03 Mn. • දේශීය අරමුදල් (17) - රුපියල් මිලියන 1050	2018 - 2022

2. අමාත්‍යාංශයේ ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1. විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

රටේ සංවර්ධනය සඳහා සුවිශේෂී දායකත්වයක් දක්වන ප්‍රමුඛ රාජ්‍ය අමාත්‍යාංශයක් වශයෙන් පැවරී ඇති විෂය පථයට අනුව ජනතාවට කාර්යක්ෂම හා සුවපහසු සේවයක් ලබා දීමත්, ආර්ථික ක්‍රියාවලියට දායකත්වය දැක්වීමත් මෙම අමාත්‍යාංශයේ ප්‍රධාන අරමුණු වේ. මෙම අරමුණු ඉටුකර ගැනීම සඳහා මධ්‍යකාලීන උපාය මාර්ගික සැලැස්මක් යටතේ විවිධ ව්‍යාපෘති හා වැඩසටහන් රාශියක් මේ වන විට හඳුනාගෙන ඇති අතර එයින් සමහරක් මේ වන විට ඉතා සාර්ථකව ක්‍රියාත්මක වේ. මෙම අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අනෙක් ආයතන හතර ද සේවාලාභීන්ට වඩාත් නම්‍යශීලී වූ හා වඩාත් සමීප වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන අතර සුහුරු තාක්ෂණය මඟින් වඩාත් විනිවිදභාවයකින් යුක්තව සේවා සැලසීමට නිරන්තරව කටයුතු කරනු ඇත. ඒ අනුව, මෙම රාජ්‍ය අමාත්‍යාංශය එයට අයත් ආයතන සම්බන්ධීකරණය කර ගනිමින් වැඩසටහන් රාශියක් 2021 වසර තුළ දී ක්‍රියාත්මක කරන ලදී. එහිදී ලැබූ විශේෂ ජයග්‍රහණ, මුහුණ දුන් අභියෝග හා ඉදිරි සැලසුම් පිළිබඳව සංක්ෂිප්ත සටහනක් මෙම කාර්ය සාධන වාර්තාව මඟින් ඉදිරිපත් කර ඇත.

2.1.1. විශේෂ ජයග්‍රහණ

2.1.1.1. විශේෂ ව්‍යාපෘති වාර්තා සකස් කිරීම හා අනුමැතිය ලබා ගැනීම

මෙම අමාත්‍යාංශයේ උපදෙස් හා මඟ පෙන්වීම යටතේ විශේෂ ව්‍යාපෘති යෝජනා සකස් කර ව්‍යාපෘති සංකල්ප පත්‍ර සමඟ අවශ්‍ය අනුමැතීන් සඳහා ඉදිරිපත් කරනු ලැබී ය. ඒවා පහත දැක්වේ.

- **හරිත ප්‍රවාහන සංකල්පය ක්‍රියාවට නැංවීම සඳහා කොළඹ වාණිජ නගරය ආශ්‍රිතව විදුලි හා දෙමුහුන් බස් රථ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.**

වර්තමාන රජයේ ‘‘සෞභාග්‍යයේ දැක්ම’’ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව හරිත ප්‍රවාහන සංකල්පයට අනුගත වෙමින් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන ඉලක්කයන් සපුරාලීම ද ජාත්‍යන්තර පරිසර ප්‍රඥප්තීන්ට අනුගතව දේශගුණික විපර්යාසයන්ට මුහුණදීම සඳහා ජාතික වශයෙන් නිර්ණය කළ දායකත්වයන්ට අනුගත වීම යන අරමුණු පෙරදැරි කරගෙන මහ කොළඹ වාණිජ නගරය තුළ යෝජිත නවත්වා යාමේ පහසුකම් සහිත නාගරික බස් රථ සේවාවක් (Park & Ride City Bus Service) ආරම්භ කිරීම මෙම ව්‍යාපෘතිය යටතේ අපේක්ෂා කෙරේ.

මෙම ව්‍යාපෘතිය යටතේ මහ කොළඹ නාගරික ප්‍රදේශය ආවරණය කරගනිමින් ප්‍රධාන ප්‍රවේශ මාර්ග 7ක් ඔස්සේ ධාවනය කරවීම සඳහා විදුලි බලයෙන් ක්‍රියාත්මක වන වායු සමනය කළ නවීන පහසුකම් සහිත ආසන 26-30 ධාරිතාවය සහිත බස් රථ 30ක් ද, ආසන 26-30 දෙමුහුන්, පත්ල පහත් බස් රථ 70ක් ද, ආසන 42-45 දෙමුහුන්, පත්ල පහත් බස් රථ 40ක් ද මිලදී ගැනීමට නියමිත ය.

මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය අරමුදල් 2022 ජාතික අයවැය යටතේ ප්‍රවාහන අමාත්‍යාංශ වැය ශීර්ෂ 114-2-3-12-2506 යටතේ වෙන් කරන ලද රුපියල් මිලියන 2000ක ප්‍රතිපාදනයෙන් රුපියල් මිලියන 1700ක් යොදාගෙන පළමු අදියර ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන අතර දෙවන සහ තෙවන අදියර 2023 හා 2024 ජාතික අයවැය යෝජනා යටතේ ලබා ගැනීමට යෝජනා කර ඇත. ශ්‍රී ලංගමය යටතේ ක්‍රියාත්මක කෙරෙන මෙම ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීමට කටයුතු කර ඇත.

- **රියදුරු ගම්මාන ව්‍යාපෘතිය**

දකුණු ආසියානු කලාපයේ අනෙකුත් රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ මාර්ග අනතුරු ප්‍රමාණය ඉතා ඉහළ අගයක් ගන්නා අතර එයට එක් ප්‍රධාන හේතුවක් ලෙස හඳුනාගෙන ඇත්තේ රියදුරන්ගේ නොසැලකිලිමත්භාවයයි. මේ පිළිබඳව අවධානය යොමු කළ මෙම අමාත්‍යාංශය ප්‍රායෝගික හා න්‍යායාත්මක විධිමත් රියදුරු පුහුණුවක් ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදයන් භාවිතා කරමින්, එකම ස්ථානයක සිදු කරන රියදුරු ගම්මාන සංකල්පය හඳුන්වාදීම සඳහා මෙම ව්‍යාපෘති යෝජනාව සකස් කර ඇත. මෙම රියදුරු ගම්මාන ව්‍යාපෘතිය දිස්ත්‍රික්කයකට එකක් බැගින් ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 ආවරණය කරමින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන අතර ගම්පහ, කළුතර, කුරුණෑගල හා අනුරාධපුර දිස්ත්‍රික්කවල රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජනා වී ඇත. ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇති මෙම ව්‍යාපෘතිය සඳහා දේශීය හා විදේශීය ආයෝජකයන් කිහිප දෙනෙකු මේ වන විට සිය කැමැත්ත ප්‍රකාශ කර ඇත.

- **මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සඳහා පරිලෝඛිත කොෂ්ඨාගාරයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය (Digital Archive)**

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සතුව මේ වන විට ලිපි ගොනු මිලියන 12ක් පමණ පවතින අතර මෙම ලිපිගොනු වර්ගීකරණය කර විධිමත් පිළිවෙලට අසුරා නොමැති වීම නිසා අවශ්‍ය අවස්ථාවල දී ආපසු ලබා ගැනීම ඉතා දුෂ්කර වී ඇත. පොලීසියට හා වෙනත් නීතිමය කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු ලබාදීමේ දී ලිපි ගොනු සොයා ගැනීමට නොහැකිවීමෙන් මෙම ආයතනයේ නිලධාරීන් ද බොහෝ අපහසුතා වලට ලක්වී ඇත. මෙම අවිධිමත් තත්ත්වය විවිධ අක්‍රමිකතා සිදුවීමට ද බලපාන නිසා මෙයට පිළියමක් වශයෙන් තොරතුරු කඩිනමින් ලබා ගත හැකි පරිලෝඛිත කෝෂ්ඨාගාරයක් (Digital Archive) ඉදිකර පවත්වාගෙන යාමටත් ලිපි ගොනු සංරක්ෂණය කර කළමනාකරණය කර ගැනීම සඳහා බහාලුම් යොදාගනිමින් ලේඛනාගාරයක් (Container Record Room) ඉදිකිරීමටත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි. ඒ සඳහා රු. මිලියන 800ක් 2022 අයවැය මඟින් ලබා ගැනීමට මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ ද අනුමැතිය ලැබී ඇත.

කෙසේ වෙතත් ප්‍රවාහන අමාත්‍යාංශයට 2022 අයවැය ප්‍රතිපාදන යටතේ වැය ශීර්ෂ 114-2-3-12-2506 යටතේ වෙන්කරන ලද රුපියල් මිලියන 2000ක ප්‍රතිපාදන යොදාගනිමින් පහත සඳහන් උප ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු සැලසුම් කර ඇත.

01. බහාලුම් යොදාගනිමින් ලිපිගොනු ගබඩා කිරීමේ පහසුකම් ඇති කිරීම - රුපියල් මිලියන 90
02. සුහුරු තාක්ෂණය යොදාගනිමින් පෝලිම් කළමනාකරණ ක්‍රමවේදය ඇතුළු නවීන පහසුකම් වැඩිදියුණු කිරීම - රුපියල් මිලියන 100

- **වාහන මාර්ග ධාවන යෝග්‍යතා මධ්‍යස්ථාන පිහිටුවීම**

දැනට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන වාහන වායු විමෝචන වැඩ සටහන තව දුරටත් විධිමත් කර වාහන මාර්ග ධාවන යෝග්‍යතා පරීක්ෂණයක් සෑම වාහනයකට ම සිදුකර සහතිකයක් ලබාදීම මෙම වැඩසටහන මඟින් බලාපොරොත්තු වේ. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම තුළින් වාහන මඟින් සිදුවන පාරිසරික හානිය අවම වීම පමණක් නොව මාර්ග අනතුරු අවම කිරීම, වාහන නියමිත පරිදි නඩත්තු කිරීමට වාහන හිමියන් පෙළඹවීම හා වාහනවල ඉන්ධන කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම වැනි අනෙකුත් ප්‍රතිලාභ අත්කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත. රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ සිදු කිරීමට නියමිත මෙම වැඩසටහන සඳහා වන මාර්ගෝපදේශ විද්වත් කමිටුවක් මඟින් සකස් කර ව්‍යාපෘති යෝජනාව සමඟ ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති අතර එහි නිර්දේශ පරිදි ඒ සඳහා වූ අධ්‍යයන වාර්තාවක් සකස් කිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇත.

- **අම්පාර ටයර් කර්මාන්ත ශාලාව ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය**

ශ්‍රී ලංගමය බස් රථ සඳහා මාසයකට පෙර සවි ටයර් (Pre-cured) 10,500 ක් පමණ අවශ්‍ය වන නමුත් අම්පාර ටයර් කර්මාන්තශාලාවේ දැනට මාසික නිෂ්පාදනය පෙර සවි ටයර් 1100 ක ප්‍රමාණයකි. අවශ්‍ය අනෙක් ටයර් ප්‍රමාණය පෞද්ගලික අංශයෙන් ප්‍රසම්පාදනය කරනු ලබන අතර ඒ සඳහා මසකට රුපියල් මිලියන 69 ක් පමණ වැය වේ. මෙම ව්‍යාපෘතිය යටතේ අම්පාර කම්හලේ දැනට භාවිතා කරනු ලබන යල්පැන ගිය යන්ත්‍රෝපකරණ වෙනුවට නවීන යන්ත්‍ර සූත්‍ර සවි කිරීමට අපේක්ෂා කරන අතර නිෂ්පාදන ප්‍රමාණය 75%කින් වර්ධනය කරගැනීමට බලාපොරොත්තු වේ. ඒ අනුව දැනට පවත්නා මිල ගණන් යටතේ මෙම ටයර් කර්මාන්ත ශාලාව ආරම්භ කළ පසු වර්ෂයකට රුපියල් මිලියන 164 ක් පමණ ඉතිරි කර ගැනීමට ශ්‍රී ලංගමයට හැකිවනු ඇත.

රුපියල් මිලියන 200 ක ප්‍රතිපාදන යටතේ 2022 වසරේදී ක්‍රියාත්මක කිරීමට නියමිත මෙම ව්‍යාපෘතිය අදියර දෙකක් යටතේ ක්‍රියාත්මක කිරීමට ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී තිබුණි. කෙසේ වෙතත් 2022 අයවැය මඟින් රුපියල් මිලියන 50 ක් අම්පාර ටයර් කර්මාන්තශාලාව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වෙන්වී ඇති බැවින් ඒ සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු මේ වන විට සිදුකරමින් පවතී.

- **ශ්‍රී ලංගම බස් රථ අලුත්වැඩියාව සඳහා ඇන්ජින් කට්ටල 500 ක් ලබා ගැනීම**

ශ්‍රී ලංගම සතුව දැනට පවතින බස්රථ වලින් 45%ක් පමණ (3130) අවුරුදු 12 ට වඩා පැරණි ආර්ථික වශයෙන් සක්‍රීය නොවන බස් රථ වේ. අවුරුදු 5-12ත් අතර බස් රථ සංඛ්‍යාව 2705 (39%) කි. ශ්‍රී ලංගමයේ දැනට පවතින බස් රථ ඇණිය මෙම තත්ත්වයේ ම පවත්වා ගැනීම සඳහා වසරකට සාමාන්‍යයෙන් බස් රථ 500ක් පමණ රථ ඇණියට එකතු කළ යුතු වේ. එහෙත් පවතින තත්ත්වය යටතේ මෙම බස් රථ මිලදී ගැනීම සඳහා ශ්‍රී ලංගමයේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන අතර නව බස් රථ මිලදී ගැනීම සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ද ලබා ගැනීම ගැටලුවක්ව පවතී. මෙයට විකල්පයක් වශයෙන් පැරණි බස් රථ 500ක් අලුත්වැඩියා කර ධාවනයට එක්කිරීම සඳහා මෙම ව්‍යාපෘති වාර්තාව ඉදිරිපත් කරන ලදී. මෙම ව්‍යාපෘති යෝජනාව මඟින් බස් රථ අලුත්වැඩියා කිරීමට ප්‍රාදේශීය වැඩපොල වලට අවශ්‍ය නවීන යන්ත්‍රෝපකරණ ද මිලදී ගැනීමට අපේක්ෂිත අතර මෙම සමස්ත ව්‍යාපෘතිය සඳහා වැයවන ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 1700 ක් වේ. මෙම ව්‍යාපෘතිය 2022 හා 2023 වසර තුළදී අදියර දෙකකින් ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී තිබුණ ද ඒ සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන වෙන් වී නැත.

- **ශ්‍රී ලංගම සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය**

ලෝක බැංකු කොවිඩ් 19 හදිසි ප්‍රතිචාරාත්මක පහසුකම යටතේ ශ්‍රී ලංගමයට අයත් තෝරාගත් ඩිපෝවල සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය මඟින් පුරුෂ පාර්ශවය සඳහා වැසිකිළි පද්ධති 16 ක් හා කාන්තා පාර්ශවය සඳහා වැසිකිළි පද්ධති 15 ක් වැඩිදියුණු කිරීම, රුපියල් මිලියන 128.07 ක ප්‍රතිපාදන යටතේ මේවන විට ක්‍රියාත්මක වේ. මෙම වැඩසටහන, අමාත්‍යාංශයේ තාක්ෂණ අංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අතර 2022 වසරේ තෙවන කාර්තුව තුළදී නිම කිරීමට අපේක්ෂා කෙරේ. මේවන විට සියලු ඇස්තමේන්තු සකස්කර ප්‍රවාහන අමාත්‍යාංශයට යොමුකර ඇති අතර ප්‍රසම්පාදන කටයුතු නිම වෙමින් පවතී.

2.1.1.2. වෙනත් සංවර්ධන වැඩසටහන්

- **විදුලි බස් රථ නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය**

හරිත සංකල්පය යටතේ විදුලි බස් රථ දේශීය ප්‍රවාහන සේවාවට හඳුන්වා දීම සඳහා දේශීය හා විදේශීය ආයෝජකයන් කිහිප දෙනෙකු මේ වනවිට කැමැත්ත පලකර සිය යෝජනා අමාත්‍යාංශය වෙත ලබා දී ඇත. මෙම යෝජනා පිළිබඳව ඇගයීමේ කටයුතු සිදුවන අතර ඵලදායී යෝජනා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. තව ද තෝරාගත් ඩිපෝවල හා දුම්රිය ස්ථානවල ප්‍රතිලාභ බෙදා ගැනීමේ පදනම මත සූර්ය පැනල මඟින් විදුලිය නිපදවා එම ආයතනවලටම ලබා දීමේ ව්‍යාපෘති වාර්තාවක් එක් පෞද්ගලික ආයෝජකයෙක් විසින් ඉදිරිපත් කරනු ලැබූ අතර එම යෝජනාව සඳහා ශ්‍රී ලංගමය හා දුම්රිය දෙපාර්තමේන්තුව සිය එකඟතාවය ද පලකර ඇත. ඒ අනුව, එහි ඉදිරි කටයුතු 2022 වර්ෂයේ දී සිදු කිරීමට නියමිත ය.

- **ජාතික වාහන නියාමන ප්‍රතිපත්තිය සකස් කිරීම**

ශ්‍රී ලංකාවේ ගොඩබිම තුල ධාවනය සඳහා විදේශයකින් ආනයනය කරන හෝ මෙරටදී නිෂ්පාදනය හෝ එකලස් කරනු ලබන වාහන ලියාපදිංචියේ සිට භාවිතයෙන් බැහැර කිරීම දක්වා වන විවිධ භාවිතයන් තුළින් මහජනයාට හා පරිසරයට අවම හානියක් වන පරිදි හා තිරසර සංවර්ධනයට අනුකූල වන පරිදි එම වාහන භාවිතා කිරීම හා කළමනාකරණය කිරීම සඳහා වන නියාමන ක්‍රමවේදයක් සකස් කිරීමට මෙම අමාත්‍යාංශය අපේක්ෂා කරයි. එය 2009 දී සම්පාදනය කර ඇති ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය සඳහා අනුශාංගිකව භාවිතා කිරීමට සකස්කරන අතර මෙවන විට හඳුනාගත් ප්‍රධාන විෂය ක්ෂේත්‍ර 54 ක් යටතේ විවිධ පාර්ශව සමඟ වැඩමුලු කිහිපයක් පවත්වා දළ කෙටුම්පතක් සකස් කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. ප්‍රවාහන ක්ෂේත්‍රයේ වර්තමාන තත්ත්වය, අවශ්‍යතා, අභියෝග හා ගැටළු පිළිබඳව පුළුල් අධ්‍යයනයක් යටතේ ප්‍රවාහනයට සම්බන්ධ පාර්ශවකාර ආයතනවල දායකත්වය ලබා ගනිමින් පිලියෙල කරන මෙම ජාතික වාහන නියාමන ප්‍රතිපත්තිය 2022 වසරේ සැප්තැම්බර් මස කෙටුම්පත් කර අවසන් කිරීමටත් ඉන්පසුව අනුමැතිය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමටත් නියමිතය.

- **සුහුරු තාක්ෂණය භාවිතයෙන් මහජන සේවා කාර්යක්ෂම කිරීම**

මෙම අමාත්‍යාංශයේ සෘජු මැදිහත්වීම යටතේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය හා ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය වැනි ආයතනවල නවීන තාක්ෂණය භාවිතයෙන් මහජන සේවා වඩාත් කාර්යක්ෂම කිරීමේ වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. මාර්ගගත ක්‍රම මඟින් අන්තර් පුද්ගල සබඳතා හා වේලාව වෙන්කරවාගෙන සේවා ලබා ගැනීම (On-Line Appointment), පෝලිම් කළමනාකරණය (Queue Management), ඊ මෝටරින් ව්‍යාපෘතිය (E-Motoring), වාහන දත්ත ගබඩාකරණය සඳහා පරිගණකගත කෝෂ්ඨාගාරයක් ස්ථාපිත කිරීම (Digital Archive) ආදිය මේ යටතේ හඳුන්වා දීමට බලාපොරොත්තු වේ. ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය විසින් මේ වන විටත් කලින් වේලාව වෙන්කර ගැනීමේ ක්‍රමය දිවයින පුරා ක්‍රියාත්මක කර ඇත.

- **රියදුරු පුහුණු පාසල් නියාමන ක්‍රමවේදයක් සකස් කිරීම**

ශ්‍රී ලංකාව තුළ රියදුරු උපදේශකවරුන් යටතේ රිය පුහුණුව ලබාදෙන රියදුරු පාසැල් විශාල සංඛ්‍යාවක් පවතී. මේවා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විය යුතු වුව ද නිසියාකාර නියාමනයක් මෙතෙක් සිදුව නැත. මෙම තත්ත්වය ද මෙරට රිය අනතුරු ප්‍රමාණය ඉහළ යාමට හේතුවිය හැකි බැවින් රියදුරු පාසැල් සඳහා මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස්කර නියාමනය කිරීම මඟින් උසස් ගුණාත්මක පුහුණුවක් ආධුනිකයන් හට ලබා ගැනීමේ පහසුකම් ඇති කිරීමට මෙම අමාත්‍යාංශය කටයුතු කරගෙන යයි. ඒ සඳහා දිස්ත්‍රික් මට්ටමින් කමිටු පත්කර ඇති අතර එහි ප්‍රථම පරීක්ෂාව අමාත්‍යාංශ ලේකම්තුමාගේ මූලිකත්වයෙන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ සිදුකරන ලදි. මෙම පරීක්ෂා කිරීමේ වැඩසටහන 2022 වසර තුළ දී දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

- **දිස්ත්‍රික් ප්‍රවාහන කළමනාකරණ කමිටු පිහිටුවීම**

ප්‍රවාහන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ප්‍රාදේශීය මට්ටමේ ගැටලු හඳුනාගෙන ඒවා ප්‍රාදේශීය මට්ටමින් ම නිරාකරණය කර ගැනීමේ අරමුණින් ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ උපදෙස් හා මහ පෙන්වීම පරිදි දිවයිනේ සියලුම දිස්ත්‍රික් ආවරණය වන පරිදි දිස්ත්‍රික් ප්‍රවාහන කළමනාකරණ කමිටු පිහිටුවීමට අපේක්ෂා කෙරේ. මෙම වැඩසටහනේ ප්‍රථම කමිටුව මහනුවර දිස්ත්‍රික්කයේ ද එහි දෙවැනි කමිටුව මාතර දිස්ත්‍රික්කයේ ද මේ වන විට පිහිටුවා ඇත.

- **ආයතනවල බඳවා ගැනීමේ පටිපාටි සකස් කිරීම**

මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය හා ලක්දිව ඉංජිනේරු සමාගම යන ආයතනවල කාලයක සිට නොවිසඳී පැවති බඳවා ගැනීමේ පටිපාටි අදාළ ආයතන සමඟ එක්ව සකස්කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යැවීමට මෙම අමාත්‍යාංශයට හැකිවිය. ඒ අනුව, ස්ථාවර කාර්ය මණ්ඩලයක් ස්ථාපිත වීම තුළින් සේවක සුරක්ෂිතතාවය තහවුරුවීම මෙම ආයතනයන්ගේ කාර්යක්ෂමතාවය වර්ධනය වීමට හේතු වනවා ඇත.

- **බස් රථ රියදුරන්ට විධිමත් න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුවක් ලබාදීම**

ශ්‍රී ලංකාවේ සිදුවන මාර්ග අනතුරු ප්‍රමාණය කලාපයේ අනෙක් රටවල් හා සැසඳීමේ දී ඉතා ඉහළ අගයක් ගැනීම බරපතල සමාජ හා ආර්ථික ගැටලු ඇති කිරීමට හේතු වී ඇත. විශේෂයෙන් ම පවුලක ආර්ථිකයට සෘජු දායකත්වයක් දක්වන පුද්ගලයා මරණයට පත්වීම හෝ අකර්මන්‍ය වීම එම පවුල අසරණභාවයට පත්වීමට හේතුවක් වේ. එසේ ම රිය අනතුරුවලට භාජනය වන පුද්ගලයන්ගෙන් වැඩි පිරිසක් තරුණ පිරිස වීම රටේ ශ්‍රම බලකාය කෙරෙහි ද අහිතකර අන්දමට බලපායි. මෙම රිය අනතුරු වලට ප්‍රධාන හේතුවක් ලෙස හඳුනාගෙන ඇත්තේ රියදුරන්ගේ නොසැලකිල්ල හා අවිනීතභාවයයි. මෙයට පිළියමක් වශයෙන් විධිමත්ව හා ආචාරශීලී ලෙස රිය පැදවීම පිළිබඳව සති දෙකක නේවාසික න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුවක් රියදුරන්ට ලබා දීමේ වැඩසටහනක් යුද්ධ හමුදාව, ජාතික ගමනාගමන කොමිෂන් සභාව හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සමඟ එක්ව ක්‍රියාත්මක කිරීමට මෙම අමාත්‍යාංශය කටයුතු යොදා ඇත. කොවිඩ් වසංගත තත්ත්වය නිසා ප්‍රමාද කරනු ලැබූ මෙම වැඩසටහන 2022 වසර තුළ පැවැත්වීමට කටයුතු සැලසුම් කර ඇත.

- **“මහමඟ මිතුරෝ” නමින් ස්වේච්ඡා සංවිධානයක් ආරම්භ කිරීම**

මාර්ග අනතුරු නිවාරණය හා මාර්ග වල රිය අනතුරු සිදුවීමෙන් පසුව අනතුරට ලක් වූවන් කඩිනමින් රෝහල් කරා රැගෙන යාම සඳහා උපකාරීවන “මහ මඟ මිතුරෝ” නමින් ස්වේච්ඡා සංවිධානයක් ආරම්භ කිරීමට මෙම අමාත්‍යාංශය තීරණය කර ඇත. මේ සඳහා ඉදිරිපත් වන තරුණ තරුණියන්ට මාර්ග ආරක්ෂාව හා ප්‍රථමාධාර පිළිබඳව විධිමත් පුහුණුවක් අදාළ ප්‍රවීනයන් මඟින් ලබා දීමට බලාපොරොත්තු වේ. මෙම වැඩසටහන මුළු දිවයින ම ආවරණය වන පරිදි කොට්ඨාස 44 කණ්ඩායම් 44ක් ලෙස ක්‍රියාත්මක කරනු ලබන අතර මෙහි මුල් ම ස්වේච්ඡා සංවිධානය මාතර දිස්ත්‍රික්කයේ පිහිටුවීමට කටයුතු

යොදා ඇත. මෙම වැඩසටහනේ මූලික ඉලක්කය වී ඇත්තේ 2030 දී 2020 වර්ෂයේදී සිදුවූ රිය අනතුරු ප්‍රමාණය 50%කින් අඩු කර ගැනීමයි.

- **ආයතනීය පරිපාලන හා කළමනාකරණ කටයුතු විධිමත් කිරීම**

මෙම අමාත්‍යාංශයට අයත් ආයතනවල පරිපාලන හා කළමනාකරණ කටයුතු විධිමත් කිරීම සඳහා අධීක්ෂණ නිලධාරීන් පත්කර ඇත. ඒ අනුව, ආයතනයේ කාර්යභාරය හා විෂය පථය අනුව සිදුවන මහජන සේවා නිරන්තරයෙන් ඇගයීමට ලක්කරනු ලැබේ. එසේම කාලීන අවශ්‍යතාවය මත අණ පනත් සංශෝධනය කිරීමට කටයුතු කරනු ලබන අතර මේ වන විට මෝටර් වාහන පනත හා ශ්‍රී ලංගම පනත සංශෝධනය කිරීමට කමිටු පත්කර ඉදිරි කටයුතු සිදුවනු ඇත.

- **ආයතන, ප්‍රියමනාප හා මහජන හිතකාමී ස්ථාන බවට පත් කිරීම**

රාජ්‍ය ආයතන සේවාලාභීන්ට ප්‍රියමනාප හා කාර්යක්ෂම ස්ථාන බවට පත්කිරීම සඳහා අවශ්‍ය සහයෝගය හා මඟ පෙන්වීම මෙම අමාත්‍යාංශය විසින් නිරන්තරයෙන් ලබා දෙනු ඇත. ඒ අනුව, ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යාල හා ශාඛා කාර්යාල විධිමත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත. ඒ යටතේ සේවාලාභීන්ට විවේක ගැනීමට හා ඉඳගැනීමට අවශ්‍ය පහසුකම් සම්පාදනය, ආයතනය තුළ රූපවාහිනී යන්ත්‍ර භාවිතා කර සේවාලාභීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම මෙන් ම ආයතනීය සේවා පිළිබඳව මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය මඟින් ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ද ක්‍රියාත්මක වනු ඇත.

2.1.1.3. නීති/ අණපනත් සහ ප්‍රතිපත්ති සකස් කිරීම

මෙම අමාත්‍යාංශය පිහිටුවීමේ කාර්යයන් අතරට අමාත්‍යාංශය යටතට ගැනෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන් හි විෂයයන් හා කාර්යයන්ට අදාළව ප්‍රතිපත්තීන් සම්පාදනය සහ අදාළ නීති අණ පනත් කාලීන අවශ්‍යතා අනුව සංශෝධනය කිරීම හා අණ පනත් ඇති කිරීම අපේක්ෂා කෙරේ. ඒ අනුව 2021 වර්ෂය තුළ පහත කර්තව්‍යයන් සිදු කරන ලදී.

1. ත්‍රී රෝද රථ විකරණයට අදාළ නියෝග 2021.08.14 දින අංක 2240/37 දරන ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කිරීම
2. මෝටර් වාහන ආරක්ෂක හිස් වැසුම් සඳහා නව රෙගුලාසි සකස් කිරීම සඳහා අදාළ කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කිරීම
3. වාහන නියාමනය සඳහා රාජ්‍ය ප්‍රතිපත්තියක් සකස් කිරීම
    - මෙම වැඩසටහන 2021.11.29 ප්‍රවාහන අමාත්‍යාංශ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කරන ලද අතර මෙය පාර්ශවකාර ආයතන 25ක නියෝජිතවරුන් 56 දෙනෙකුගේ සහභාගීත්වයෙන් මාසිකව රැස්වීම් පැවැත්වේ. 2022 සැප්තැම්බර් මාසයේදී මූලික කෙටුම්පත අවසන් කිරීමට අපේක්ෂිතය

4. කොන්දොස්තරවරයෙකු නොමැතිව බස්රථ ධාවනයට අදාළව නව රෙගුලාසි සකස් කිරීමට ප්‍රතිපත්තිමය එකඟතාවය ලබා ගැනීමට පළාත් ආණ්ඩුකාරවරුන් වෙත යොමුකර ඇත. මේ සඳහා පත් කරන ලද කමිටුව මඟින් මූලික කෙටුම්පත ලැබී ඇති අතර එය නිරීක්ෂණ සඳහා පාර්ශවකරුවන් වෙත යොමු කර ඇත.
5. පූර්ණ ශ්‍රව්‍යාබාධිත අය සඳහා රියදුරු බලපත්‍ර ලබා දීම
    - මේ සම්බන්ධව මූලික සාකච්ඡා කිහිපයක් පැවැත්වූ අතර වෙනත් රටවල ක්‍රියා කරනු ලබන ආකාරය පිළිබඳව තොරතුරු ලබා ගනිමින් පවතී.
6. වාහන වේග සීමා නීර්ණය කිරීමට අදාළ කෙටුම්පත පාර්ශවකාර ආයතන වෙත නිරීක්ෂණ සඳහා යොමු කිරීම
7. ශ්‍රී ලංගම පනත වෙනස් කිරීම සඳහා අතිරේක ලේකම් (සංවර්ධන) ගේ ප්‍රධානත්වයෙන් කටයුතු කිරීම
8. විද්‍යුත් මෝටර් ට්‍රයිසිකල් (ත්‍රී රෝද රථ) ලියාපදිංචි කිරීමේ දී අදාළ වන අර්ථ නිරූපනය සංශෝධන කිරීමට අදාළ අවසන් පනත් කෙටුම්පත ප්‍රවාහන අමාත්‍යතුමාගේ අනුමැතියට යොමු කර ඇත.
9. වාහන වායු විමෝචන භාරකාර අරමුදල මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ අංශයක් බවට පත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම.
10. 2017.09.22 දිනැති අංක 2037/23 දරන අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් 2018.01.01 සිට ක්‍රියාත්මක කිරීමට පනවා තිබූ ත්‍රී රෝද රථ සඳහා මීටර් සවි කිරීම නැවත ක්‍රියාත්මක කිරීම
11. ලක්දිව - ඒකල පිහිටි ඉඩම සඳහා නිදහස් බලපත්‍රයක් ලබා ගැනීමට අදාළ කටයුතු කිරීම
12. ශ්‍රී ලංගම විසින් භුක්ති විඳිනු ලබන ඉඩම්වල නිරවුල් අයිතිය ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කිරීම

2.1.1.4. අන්තර් ජාතික සහයෝගීතාවන් සඳහා වන සම්මුතීන්ට අයත් වැඩසටහන් සඳහා දායකත්වය දැක්වීම

- **වියානා සම්මුතිය -**

1949 වර්ෂයේ දී අත්සන් කරන ලද ජිනීවා සම්මුතියට ශ්‍රී ලංකාව අත්සන් කර ඇති අතර 1968 වර්ෂයේ දී අත්සන් කරන ලද වියානා රථ වාහන සම්මුතියට ශ්‍රී ලංකාව ද ඇතුළත් කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා වන විද්වත් කමිටුව පත් කිරීමට අදාළ ආයතන වලින් නාම යෝජනා කැඳවා ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු සිදුකරනු ඇත.

- **ජාතික නිර්ණය කළ දායකත්වය** (NDCs) **-**

යහපත් පාරිසරික තත්ත්වයක් අනාගත පරපුරට උරුම කර දීම සඳහා පරිසර විනාශය නිසා ඉහළ යන ගෝලීය උෂ්ණත්වය අවම කිරීමේ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමේ වැඩසටහනට මෙම අමාත්‍යාංශය

ද සිය දායකත්වය දක්වයි. ඒ අනුව, පරිසර අමාත්‍යාංශයේ සම්බන්ධීකරණය යටතේ මෙම අමාත්‍යාංශය විසින් එයට අයත් ආයතන ද දැනුවත්කර ජාතික නිර්ණය කළ දායකත්ව වැඩසටහන් (National Determine Contribution - NDCs) හා ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි.

2.1.2. අමාත්‍යාංශය මුහුණ දෙන අභියෝග හා ගැටලු

- පෞද්ගලික වාහන භාවිතයට හුරුවී ඇති මහී ජනතාව පොදු ප්‍රවාහනය කෙරෙහි ආකර්ෂණය කර ගැනීම
- රාජ්‍ය-පෞද්ගලික හවුල් ව්‍යාපාර ක්‍රියාත්මක කිරීමේ දී ආයතනීය අණ පනත්, නීති හා රෙගුලාසි සංශෝධනය කිරීම සඳහා දීර්ඝ කාලයක් ගතවීම
- හරිත සංකල්පය යටතේ විදුලි බස් රථ හඳුන්වාදීමේ දී ඒ සඳහා වන ඉහළ පිරිවැය, බැටරි අපහරණය කිරීම, සේවකයන් පුහුණු කිරීම හා අවශ්‍ය යටිතල පහසුකම් සම්පාදනය කිරීම
- අවශ්‍ය කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බැවින් හා දැනට සිටින කාර්ය මණ්ඩලය නවක නිලධාරීන් බැවින් රාජකාරි ඉටු කිරීමේ දී විවිධ ගැටලු වලට මුහුණ දීමට සිදුවීම
- දැනට ක්‍රියාත්මක සේවා විධිමත් කර ශ්‍රී ලංගම ලාභ ලබන ආයතනයක් බවට පත්කිරීම
- ආයතන වල පවත්නා වංචා දූෂණ වැනි අක්‍රමිකතා අවමකර ජනතා හිතවාදී, ප්‍රියමනාප සුපිළිපන් ආයතන බවට පත්කිරීම
- නාගරික හා ග්‍රාමීය ප්‍රදේශ ආවරණය වන පරිදි පවතින බස් රථ ප්‍රමාණය හා සේවක පිරිස කළමනාකරණය කර ගැනීම
- සුහුරු තාක්ෂණික ව්‍යාපෘති හා ප්‍රවාහන යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට අපහසු වීම
- ප්‍රවාහනයට සම්බන්ධ පාර්ශවකාර ආයතන රාශියක් පවතින බැවින් ඒවා සම්බන්ධීකරණය කර ගැනීමේ අපහසුව
- 2030 වන විට 2020 වර්ෂයේ සිදු වූ මාර්ග අනතුරු ප්‍රමාණය 50% කින් අවම කර ගැනීම

2.1.3. අමාත්‍යාංශයේ ඉදිරි ඉලක්ක

- 2022 වසර තුළ හරිත ප්‍රවාහන සංකල්පය යටතේ නාගරික ප්‍රවාහනය සඳහා පරිසර හිතකාමී පත්ල පහත් සුඛෝපභෝගී නවීන බස් රථ සේවාවක් හඳුන්වාදීම
- මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව හා ප්‍රවාහන වෛද්‍ය ආයතනය යන ආයතන වල සුහුරු තාක්ෂණික ක්‍රම ප්‍රචලිත කිරීම මඟින් මහජන සේවා කාර්යක්ෂම කර ගැනීම. මේ යටතේ Digital Archive, Q – Management, IVR, E- Motoring, D- Merit system වැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- ශ්‍රී ලංගම පුනර්ජීවන වැඩසටහන ක්‍රියාත්මක කර ශ්‍රී ලංගම කාර්යක්ෂම ආයතනයක් බවට පත්කිරීම මඟින් ලාභ ලබන ආයතනයක් බවට පත් කිරීම

- Park & Ride ක්‍රමය මාර්ග තදබදය අධික නාගරික ප්‍රදේශවල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය බස් රථ සපයා ගැනීම
- රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ ප්‍රවාහන යටිතල පහසුකම් සංවර්ධනය කර මහජන අවශ්‍යතා ඉටුකර ගැනීම
- ශ්‍රී ලංගම, ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය හා ලක්දිව ඉංජිනේරු සමාගම යන ආයතනවල බඳවා ගැනීමේ පටිපාටි අනුමත කර ගැනීම මඟින් සේවක සුරක්ෂිතතාවය වර්ධනය කර ගැනීම හා සේවා ඵලදායිතාවය ඉහළ නංවා ගැනීම

එස් .එම් .ඩී .එල් .කේ .ද අල්විස්

ලේකම්

වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා

දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය

3. 2021 වසර සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසිඒ - එෆ්

2021.12.31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

රු.000

අයවැය 2021			සටහන	තත්‍ය			
				2021		2020	
-		**ආදායම් ලැබීම්**		-		-	
-		ආදායම් බදු	1	-		-	ඒසිඒ-1
-		දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-		-	
-		ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-		-	
-		බදු නොවන ආදායම් හා වෙනත්	4	-		-	
-		**මුළු ආදායම් ලැබීම් (අ)**		-		-	
-		**ආදායම් නොවන ලැබීම්**		-		-	
-		භාණ්ඩාගාර අග්‍රිම		12,696,647,613		4,471,531,542	ඒසිඒ-3
-		තැන්පතු		243,608		2,400	ඒසිඒ-4
-		අත්තිකාරම් ගිණුම්		981,667		83,221	ඒසිඒ-5
-		වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-		98,579	
-		**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**12,697,872,888**		**4,471,715,742**	
-		**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**12,697,872,888**		**4,471,715,742**	
		භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-		-	
		ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		**12,697,872,888**		**4,471,715,742**	
